# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.12.05 පැය 2350 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/2171/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**ශ්‍රී පාද වන්දනාව සඳහා පැමිණෙන බැතිමතුන්ගේ ආරක්ෂාව සම්බන්ධව දැනුවත් කිරීම - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී පාද වන්දනා වාරය 2025.12.04 වන දිනට යෙදුණු උදුවප් පුර පසලොස්වක පොහොය දිනයෙන් ආරම්භ විය. ශ්‍රී පාදස්ථානයට ළඟාවීමට ඇති හැටන් ප්‍රවේශ මාර්ගයේ ඇති මහගිරිදඹ ප්‍රදේශයේ ඇතිවූ නායයෑම් තත්ත්වය සම්බන්ධයෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ විශේෂඥ කණ්ඩායමක් විසින් එම ස්ථානයට ගොස් මේ වන විට පවතින භූ අස්ථාවරත්වය සම්බන්ධව ගවේෂණයක් සිදු කර ඇත.

ඒ අනුව එම ගමන් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිවේදනයක් නිකුත් කර ඇති අතර අදාල නිවේදනයේ නිර්දේශ ක්‍රියාත්මක කරන තුරු දැනට පවතින තත්ත්වය යටතේ හැටන් පිවිසුම ඔස්සේ ඉහත අස්ථාවර කලාපය හරහා ශ්‍රී පාදස්ථානය වෙත පිවිසීම සීමා කල යුතු බවට දැනුම්දී ඇත.

එම නිවේදනයේ සඳහන් පරිදි හැටන් ප්‍රවේශ මාර්ගයෙන් ශ්‍රී පාදස්ථානය වෙත පිවිසීම අවධානම් තත්ත්වයක් පවතින බැවින් ශ්‍රී පාදස්ථානය වන්දනාව සඳහා ඉහළට ගමන් කිරීමේදී බැතිමතුන්ගේ ආරක්ෂාව සඳහා එම ගමන් මාර්ගයේ සීමා කිරීම් සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇත. එමෙන්ම ශ්‍රී පාද වන්දනාවට අපේක්ෂා කරන බැතිමතුන් තම ප්‍රදේශයන්හි සිට ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේදී පවතින අයහපත් කාලගුණික තත්ත්වය හා ගමන් මාර්ගයන් පිළිබඳ දැඩි අවධානයෙන් හා සැලකිලිමත්ව ක්‍රියා කරන ලෙසට පොලිසිය වැඩිදුරටත් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**